# දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ/ පෙර පාසලේ අනතුරු වැළැක්වීම සඳහා වන පිරික්සුම්පත

ළමා විය යනු කායිකව සීඝ්‍ර වර්ධනයක් ඇති කාලයක් මෙන්ම, අධික කුතුහලයෙන් අවට ලෝකය පිළිබඳව සොයා බැලීමටත්, විශේෂයෙන්ම සිය අත්දැකීම් වලින් ඉගෙන ගන්නට ඉතා උනන්දුවක් දක්වන කාලයකි. ළමා වියේ මුල් අවධිය, ක්‍රීඩාවෙන් සහ විවිධ දේ සොයා බැලීම් වලින් ගහනය. අනතුරු සිදුවීම ක්‍රියාශීලී, කුතුහලයෙන් පිරි දරුවෙකු සමඟ බද්ධව පවතින නිසා, දරුවන් අනතුරු වලට ලක්වන්නට ඇති ප්‍රවණතාවය ඉහළයි. සමහර අවස්ථාවල මෙම අනතුරු ඉතාමත් බරපතල සිදුවීම් වලට පවා මුල් විය හැකිය.

නිවස හැරුණු කොට, බොහෝ දරුවන් තම කාලයෙන් වැඩිම කොටසක් ගතකරනුයේ පෙරපාසලක හෝ දිවා සුරැකුම් මධස්ථානයක ඔබත් සමඟය. එහෙයින් දරුවන් සමඟ ගතකරන ඔබගේ ආයතනය අනතුරු වලින් තොර පරිසරයක් බවට තහවුරු කිරීම, ඔවුන්ගේ මෙන්ම, ඔබේ ආරක්ෂාවටත්, ඒ වාගේම ආයතනයෙන් උසස් සේවයක් ලබාදීමටත් මහඟු පිටිවහලකි. සෑම ආකාරයේම අනතුරු වලින් දරුවන් ආරක්ෂාකර ගැනීම ඉතාමත් අපහසු වුවත්, දරුවන්ට සිදුවිය හැකි අනතුරු අවම කිරීමට ඔබට හැකියාව ඇත.

මෙම පිරික්සුම් පත්‍රය ඔබ ආයතනය සහ ඒ අවට කෙතෙක් දුරට අනතුරු රහිත තැනක්දැයි ඔබව දැනුවත් කරන සහ අනතුරුදායක තත්ත්ව පවතීනම් එම තත්ත්වයන් හඳුනා ගෙන අවම කරගැනීමට ඔබට මාර්ගෝපදේශකයක් ද වනු ඇත.

පහත සඳහන් සියළු දෑ ඔබ ආයතනයට අදාල නොවිය හැකිය. **එබැවින් ඔබ ආයතනයට අදාල ව පහත සඳහන් ආරක්ෂාකාරී පිළිවෙත් පිළිබඳව අදාල තත්ත්වයන් "✓" ලකුණකින් සටහන් කරන්න. අදාළ නොවන අයිතම සඳහා පිළිතුරු කොටුව හිස්ව තබන්න.** ඔබ ආයතනයේ පෙරපාසලක් හා දිවා සුරැකුම් මධස්ථානයක් යන දෙකම පවත්වා ගෙන යන්නේ නම් අදාළ තීරයන් දෙකම පුරවන්න.

## මූලික තොරතුරු

ආයතනයේ වර්ගය: දිවා සුරැකුම් මධ්‍යස්ථානය: පෙර පාසල: දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ පෙර පාසල:

දිස්ත්‍රික්කය: ප්‍රා. ලේ. කොට්ඨාශය: ග්‍රාම නිලධාරී කොට්ඨාශය: සෞ. වෛ. නි. කාර්යයාලය:

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාශය:

ආරම්භක වර්ෂය: ලියාපදිංචි අංකය:

ප්‍රධාන පාලක/ පාලිකාවගේ/ ගුරුභවතාගේ නම :

| දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා | | පෙර පාසලක් සඳහා | |
|---|---|---|---|
| රැකබලාගන්නන්ගේ මුළු ගණන | | ගුරුවරුන්ගේ මුළු ගණන | |
| රැකබලාගන්නන් අතුරින් ළදරු රැකවරණය පිළිබඳව පුහුණුවක් ලබා ඇති ගණන | | ගුරුවරුන් අතුරින් ළදරු ඉගැන්වීම/පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳව පුහුණුවක් ලබා ඇති ගණන | |
| රැකබලාගන්නන් අතුරින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට රැකවරණය ලබා දීමට පුහුණුවක් ලබා ඇති ගණන | | ගුරුවරුන් අතුරින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ඉගැන්වීම පිළිබඳව පුහුණුවක් ලබා ඇති ගණන | |
| දැනට රැකවරණය ලබන මුළු දරුවන් ගණන | | දැනට ඉගෙනුම ලබන මුළු දරුවන් ගණන | |
| දැනට රැකවරණය ලබන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ගණන | | දැනට ඉගෙනුම ලබන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ගණන | |

| | ආරක්ෂාකාරී පිළිවෙත් | ඔව් | නැත | අදාල නැත |
|---|---|---|---|---|
| A | ආයතනයේ ආරක්ෂාව සම්බන්ධව මූලික කරුණු | | | |
| 1 | පරිශ්‍රයට පැමිණෙන ආගන්තුකයින් සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන යයි | | | |
| 2 | විවිධ හේතූන් නිසා පරිශ්‍රයෙන් බැහැරට යන දරුවන් සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන යයි | | | |
| 3 | රැකබලාගන්නන්ගේ අනුදැනුමකින් තොරව, කිසිවෙකුට දරුවන්ට ළඟා වීමට කිසිදු අවස්ථාවක් නැත | | | |
| 4 | දෙමව්පියන් හෝ වෙනත් අමුත්තන් හෝ වැනි ඕනෑම පාර්ශවයක් විසින්, දුම්කොළ, දුම්වැටි, මධ්‍යසාර, මත්ද්‍රව්‍ය සහ වෙනත් උත්තේජක වර්ග පරිශ්‍රය තුළ පරිභෝජනය තහනම්ය | | | |
| 5 | දුම්කොළ, දුම්වැටි, මධ්‍යසාර, මත්ද්‍රව්‍ය සහ වෙනත් උත්තේජක වර්ග වල බලපෑම යටතේ සිටින කිසිම පුද්ගලයෙකුට පරිශ්‍රයට ඇතුළු වීමට කිසිදු අවසරයක් නැත | | | |
| B | [illegible] | | | |
| 6 | අවම වශයෙන් මාසයකට වරක්වත් පරිශ්‍රයේ අනතුරු අවදානම පිළිබඳව තක්සේරුවක් කරයි | | | |
| 7 | අනතුරු අවදානම පිළිබඳව වාර්තාවක් පවත්වාගෙන යයි | | | |
| 8 | අනතුරු සම්බන්ධව අවදානම් හඳුනාගෙන ඇත්තේනම්, ඒවා නිවැරදි කර ඇත | | | |
| 9 | පරිශ්‍රයේ සිදුවන සියලුම අනතුරු වාර්තා කිරීම සඳහා, අනතුරු ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. | | | |
| C | පරිශ්‍රයේ භෞතික පරිසරයේ තත්ත්වය නිසා වන අනතුරු අවදානම් වැළැක්වීම | | | |
| 10 | පරිශ්‍රය වටා අවම වශයෙන් මීටර් 100 ක් ඇතුළත කුණු කසළ රැස්කරන ස්ථාන නැත | | | |
| 11 | පරිශ්‍රයේ කුණු කසළ බැහැර කිරීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් ඇත | | | |
| 12 | පරිශ්‍රය වටා අවම වශයෙන් මීටර් 100 ක් ඇතුළත උපද්‍රවකාරී හෝ දූෂිත වූ පරිසරයක් නැත | | | |
| 13 | පරිශ්‍රය වටා අවම වශයෙන් මීටර් 100 ක් ඇතුළත තැබෑරුම් නැත | | | |
| 14 | පරිශ්‍රය ආසන්නයේ ගංගා, ඇළ, දොළ හෝ වැව් වැනි අනාරක්ෂිත ජල ප්‍රභවයන් නොමැත | | | |
| 15 | පරිශ්‍රයට ඇත්තේ එක් පොදු පිවිසුමක් (පිවිසීමේ දොරටුවක්) පමණි | | | |
| 16 | පිවිසුමට සවිමත් ගේට්ටුවක් ඇත | | | |
| 17 | ගේට්ටුව හෝ පිවිසීමේ දොරටුව දරුවන් පැමිණීමෙන් පසුව ආරක්ෂිතව අගුළු දමා වසා ඇත | | | |
| 18 | පරිශ්‍රයට විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඇතුළු සෑම දරුවෙකුටම පහසුවෙන් ප්‍රවේශ විය හැකිය | | | |
| 19 | හොඳින් ඉදිකළ තාප්පයක් හෝ ආරක්ෂිත වැටක් පරිශ්‍රය වටා ඇත (කම්බි වැට හෝ ලී වැට සුදුසු නැත) | | | |
| 20 | ගේට්ටු හා වැටවල් නිරන්තරයෙන් අළුත්වැඩියා කරමින් ශක්තිමත් හා ආරක්ෂාකාරී තත්ත්වයේ පවත්වාගෙන යයි | | | |
| 21 | ගෙවත්ත මනාව අතුගා තණකොළ තිබේ නම් ඒවා කොටට කපා ඇත | | | |

True Copy

...Disease Unit
..., Colombo 10.

M. S. Wasantha De Silva
Staff Assistant to the

| | ආරක්ෂාකාර පිළිවෙත් | ඔව් | නැත | අදාල නැත |
|---|---|---|---|---|
| **C** | **පරිශ්‍රයේ භෞතික පරිසරයේ තත්ත්වය නිසා වන අනතුරු අවදානම් වැළැක්වීම** | | | |
| 22 | ගෙවත්ත සර්පයින් රැඳී සිටිය හැකි හුඹස්, ගල් සහ ලී ගොඩවල් ආදියෙන් තොරය | | | |
| 24 | පොල්, කොස්, දෙල් ආදී ගස්වල ගෙඩි, නියමිත කාලයට කැඩීම සිදු කරයි | | | |
| 25 | ගස්වල වේලුණු හෝ දිරා ගිය අතු නැත | | | |
| 26 | ගස්වල අනතුරුදායක ලෙස ඇති අතු නිසි ලෙස කපා ඉවත් කර දමයි | | | |
| 27 | ගෙවත්ත පිරිසිදු තත්ත්වයේ ඇත | | | |
| 28 | පරිශ්‍රය තුළ අනාරක්ෂිත/ආවරණය නොකළ ළිං නැත | | | |
| 29 | පරිශ්‍රය තුළ අනාරක්ෂිත/ආවරණය නොකළ පොකුණු නැත | | | |
| 30 | පරිශ්‍රය තුළ අනාරක්ෂිත/ආවරණය නොකළ කාණු හෝ ජලාපවාහන පද්ධති නැත | | | |
| 31 | පරිශ්‍රය තුළ අනාරක්ෂිත/ආවරණය නොකළ/ විවෘත තටාක නැත | | | |
| 32 | පරිශ්‍රය තුළ අනාරක්ෂිත/ආවරණය නොකළ ස්වාභාවික ජල ප්‍රභවයන් නැත | | | |
| 33 | පරිශ්‍රය තුළ අනාරක්ෂිත/ආවරණය නොකළ කාණු හෝ ජලාපවාහන පද්ධති නැත | | | |
| 34 | පරිශ්‍රය තුළ පොකුණු, කාණු, තටාක හෝ ස්වාභාවික ජල ප්‍රභවයන් ඇත්නම් ඒවාට දරුවන්ට ප්‍රවේශ විය නොහැක | | | |
| 35 | පරිශ්‍රය තුළ අනාරක්ෂිත පල්ලම් හෝ (කඳු) බෑවුම් නැත | | | |
| 36 | පරිශ්‍රය තුළ උස් තැන් වල අනාරක්ෂිතව තබා ඇති මල් පැල/ මල් පෝච්චි වැනි දෑ නොමැත | | | |
| 37 | පරිශ්‍රය තුළ උස් තැන් වල හෝ අනාරක්ෂිතව තබා ඇති මාළු ටැංකි නොමැත | | | |
| 38 | පරිසරය තුළ විෂ සහිත (උ.දා. හබරල, මනී ප්ලාන්ට් වැනි) පැළෑටි වලින් තොරය | | | |
| 39 | පරිසරය මදුරුවන් බෝවන ස්ථාන වලින් තොරය | | | |
| 40 | ගොඩනැගිල්ලේ හෝ පරිශ්‍රයේ හෝ ක්‍රීඩා උපකරණ වල හෝ අනතුරු වියහැකි අනාරක්ෂිත ස්ථාන/ දාර හෝ කොටස් නැත | | | |
| **D** | **ගොඩනැගිල්ලේ තත්ත්වය නිසා වන අනතුරු අවදානම් වැළැක්වීම** | | | |
| 41 | ගොඩනැගිල්ලේ ගරා වැටුණු හෝ කඩා වැටීමට ආසන්න කොටස් නැත | | | |
| 42 | වහළයෙන් හෝ ජල කරාම වලින් හෝ ජල කාන්දුවීම් නැත | | | |
| 43 | වහළයේ ගරා වැටුණු හෝ කඩා වැටීමට ආසන්න කොටස් නැත | | | |
| 44 | සීලිම අනතුරුදායක ලෙස ගරා වැටුණු හෝ කඩා වැටීමට ආසන්න කොටස් නැත | | | |
| 45 | ගොඩනැගිල්ල තුළ හානියට පත් වීදුරු ජනෙල් කිසිවක් නැත | | | |
| 46 | ගොඩනැගිල්ල තුළ වාතාශ්‍රය ප්‍රමාණවත්ය (දොරවල් සහ ජනේලවලින් ආවරණය වන ප්‍රදේශය, මුළු බිත්ති ප්‍රමාණයෙන් 1/7 ක් විය යුතුය) | | | |
| 47 | වාතාශ්‍රය ලබා ගැනීම සඳහා භාවිතා කරන සියලුම දොරවල් සහ ජනේල ළමයින්ගේ මට්ටමට වඩා ඉහලින් ආරක්ෂිතව සවි කර ඇති කිර / එල් බාර් වලින් සමන්විත වේ | | | |
| 48 | ගොඩනැගිල්ල තුළ ඉඩකඩ ප්‍රමාණවත්ය | | | |
| 49 | ගොඩනැගිල්ල තුළ හොඳින් ආලෝකමත්ය | | | |
| 50 | පාසල් කටයුතු ආරම්භ කිරීමට පෙර සහ අවසන් වූ පසු ගොඩනැගිල්ල තුළ හොඳින් පිරිසිදු කරයි | | | |
| 51 | ගොඩනැගිල්ල තුළ මීයන්ගෙන් තොරය | | | |
| 52 | ගොඩනැගිල්ල තුළ උපද්‍රවකාරී කෘමීන්ගෙන් තොරය | | | |
| 53 | ගොඩනැගිල්ල තුළ විෂ සහිත පැළෑටි වලින් තොරය | | | |
| 54 | ගොඩනැගිල්ල තුළ මදුරුවන් බෝවන ස්ථාන නැත | | | |
| | තට්ටු ගොඩනැගිල්ලක් නම්, | | | |
| 55 | • තරප්පු පෙළ/ පඩි පෙළ දෙපසම ශක්තිමත් අත්වැට හෝ බිත්ති ආධාරක ඇත | | | |
| 56 | • පඩි සියල්ලම එක සමාන උසකින් යුතුය | | | |
| 57 | • පඩි පෙළ හොඳින් ආලෝකමත්ය | | | |
| 58 | • අත්වැටවල්වල දරුවන්ට නැගීමට රුකුල් දෙන හරස් අතට යන දඬු නැත | | | |
| 59 | • අත්වැටෙන් දරුවන්ට රිංගා යා හැකි වන හිදැස් නැත | | | |
| 60 | • දරුවන්ට තරප්පු පෙළ/ පඩි පෙළ භාවිතා කිරීම හැකි සෑම විටම අවම කරගෙන ඇත | | | |
| 61 | ගොඩනැගිල්ලේ බැල්කනියක් තිබේනම්, එහි ඇති ආරක්ෂිත වැට/ හරස් වැට දරුවන්ට නැගීමට හෝ රිංගා යෑමට නොහැකි හෝ උඩින් වැටෙන්නේ නැති සේ පරිදි සකසා ඇත. | | | |
| 62 | දරුවන්ට අවශ්‍ය සෑම මූලික අවශ්‍යතාවයක්ම දරුවා ඉගෙනුම ලබන තට්ටුවේම සපයා ඇත | | | |
| 63 | දරුවන් තරප්පු පෙළ/ පඩි පෙළ භාවිතා කරන්නේ නම්, ඒ සෑම විටම ඔවුන් පිළිබඳ සුපරීක්ෂාකාරී වේ | | | |
| | ගෙබිමේ තත්ත්වය | | | |
| 64 | • පොළොවේ කඩතොළු නැත | | | |
| 65 | • ගෙබිම නොලිස්සන සුළුය; වියළිය | | | |
| 66 | • බිම ලිස්සන සුළු ද්‍රව්‍ය වලින් සාදා නොමැත | | | |
| 67 | • ගෙබිමේ, විදුලි උපාංගවල වයර්, පාපිසි, කාර්පට් (බුමුතුරුණු) ආදී පැටලී වැටීමට තුඩු දිය හැකි අවදානම් දෑ නොමැත | | | |
| 68 | • ටයිල් ඇතිරූ හෝ මදින ලද ගෙබිම පිරිසිදු කිරීමෙන් පසුව වියළෙන තුරු ඒ මත ඇවිදීමෙන් වළකියි | | | |
| 69 | සියලුම පිටවීමේ ස්ථාන/ දොරටු පැහැදිලිව සඳහන් කර ඇත | | | |
| 70 | සියලුම පිටවීමේ ස්ථාන/ දොරටු සෑම විටම අවහිර බාධා වලින් තොරය | | | |
| 71 | කබඩ් වැනි ගෘහ භාණ්ඩ බිත්තියට ස්ථාවර කර ඇත | | | |
| 72 | සෑම විටම සෑම පෘෂ්ඨයක්ම කඩතොළු රහිතව අනතුරුදායක නොවන ආකාරයකින් පවත්වා ගනී | | | |
| 73 | මේස මත තබා ඇති භාණ්ඩ උඩින් වැටීම වැළැක්වීම සඳහා මේස රෙදි මේසය මතට සවි කර ඇත; නැතහොත් ඒවා නොලිස්සන සුළුය | | | |
| 74 | දරුවෙකුගේ බෙල්ල සිර වීමට තරම් දිග (අඟල් 6 ක් හෝ ඊට වැඩි) නූල් සහ රැහැන් සහිත උපකරණ සහ තිර රෙදි ළමයින්ට ප්‍රවේශ විය නොහැකි සේ තබා ඇත. | | | |

True Copy

Director
Non Communicable Disease Unit
Ministry of Health, Colombo 10.

M. S. Wasantha De Silva
Staff A...

| | ආරක්ෂාකාරී පිළිවෙත් | ඔව් | නැත | අදාළ නැත |
|---|---|---|---|---|
| E | [illegible] | | | |
| 75 | දරුවන් ගේ ඉගෙනීමේ කටයුතු සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 76 | දරුවන් ගේ විවිධ ක්‍රියාකාරකම් සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 77 | අසනීප වන දරුවන් නිවසට හෝ ප්‍රතිකාර සඳහා රැගෙන යෑමට දෙමව්පියන්ට භාර දෙනතෙක් රැඳවීම සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 78 | ආහාර පිළියෙල කිරීම සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 79 | දරුවන්ට කෑම ගැනීම සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 80 | දරුවන්ට විවේක ගැනීම හෝ නිදා ගැනීම සඳහා වෙනම ස්ථානයක් ඇත (විශේෂයෙන්ම පෙර පාසල් සඳහා) | | | |
| 81 | දරුවන්ගේ ආහාර පාන තැබීම සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 82 | දරුවන්ගේ ඇඳුම් බෑග් තැබීම සඳහා වෙනම ස්ථානයක් ඇත (විශේෂයෙන්ම පෙර පාසල් සඳහා) | | | |
| 83 | සෙල්ලම් බඩු සහ ක්‍රීඩා භාණ්ඩ තැබීම සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 84 | වෙනත් උපකරණ තැබීම සඳහා වෙනම ස්ථානයක් ඇත | | | |
| 85 | කාර්යාල කටයුතු සඳහා වෙනම ඉඩක් ඇත | | | |
| 86 | සනීපාරක්ෂක පානීය ජලය ලබා ගැනීමේ පහසුකම් ඇත | | | |
| 87 | පෙර පාසල /දිවා සුරැකුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන කාලය තුළ, පරිශ්‍රය තනිකරම පෙර පාසලේ කටයුතු සඳහා පමණක්ම යොදා ගනී; වෙනත් කිසිම කටයුත්තක් සඳහා යොදා නොගනී | | | |
| 88 | පෙර පාසල /දිවා සුරැකුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන කාලය තුළ, කිසිදු අළුත්වැඩියා කටයුත්තක් සිදු නොකෙරේ | | | |
| 89 | වීදුරු හෝ වීදුරු භාණ්ඩ අවම වශයෙන් භාවිතා වේ | | | |
| 90 | සියලුම ළමයින්ට පරිහරණය කිරීමට පන්ති කාමරයේ මුළු බිම් ප්‍රමාණය ප්‍රමාණවත් වේ ( ඉගෙනීම - පන්ති කාමරයේ එක් දරුවෙකු සඳහා වර්ග අඩි 10 ක්; සෙල්ලම් කිරීම සහ ඉගෙනීම - එක් දරුවෙකු සඳහා වර්ග අඩි 20 ක් ) | | | |
| 91 | ප්‍රමාණවත් තරම් නාන කාමර පහසුකම් ඇත | | | |
| 92 | ප්‍රමාණවත් තරම් වැසිකිළි පහසුකම් ඇත (දරුවන් 20 (විස්ස) කට ' (එක) වැසිකිළියක්) | | | |
| 93 | ප්‍රමාණවත් තරම් පිරිසිදුකාරක, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ උපකරණ ඇත | | | |
| 94 | පිරිසිදුකාරක, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ උපකරණ ආරක්ෂිතව ගබඩා කර ඇත | | | |
| 95 | ආබාධ සහිත දරුවන් සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම් ඇත (විශේෂයෙන්ම ප්‍රවේශ පහසුකම්) | | | |
| 96 | ගෘහ භාණ්ඩ හා උපකරණ, ආරක්ෂිත, පිරිසිදු හා හොඳ තත්ත්වයේ ඇත | | | |
| F | ගෘහස්ථ හා එළිමහන් ක්‍රියාකාරකම් වලින් වන අවදානම වැළැක්වීම | | | |
| 97 | නිරතුරුවම භාවිතා කරන සෙල්ලම් බඩු සහ වෙනත් උපකරණ සෝදා පිරිසිදු කර නිසි ලෙස ගබඩා කර ඇත | | | |
| 98 | ක්‍රීඩා උපකරණ දෛනිකව සෝදා විෂබීජහරණය කරනු ලැබේ | | | |
| 99 | අනතුරුදායී උපකරණ/ මෙවලම් නැත | | | |
| 100 | උපද්‍රවකාරී/ අනතුරුදායී උපකරණ/ මෙවලම් නිර්මාණාත්මක උපකරණ භාවිතයේ නොමැති විට, ආරක්ෂාකාරී ලෙස ගබඩා කර තබයි | | | |
| 101 | උපද්‍රවකාරී/ අනතුරුදායී උපකරණ/ මෙවලම් නිර්මාණාත්මක උපකරණ භාවිතා කරන්නේ නම්, සෑම විටම අධීක්ෂණය කරයි | | | |
| 102 | නිර්මාණාත්මක උපකරණ (යකඩ/ ෆයිබර් කෙළි වැනි දෑ වලින් සෑදූ) ආරක්ෂාකාරී ලෙස භාවිතයට හුරු කරයි | | | |
| G | එළිමහන් ක්‍රීඩා උපකරණ වලින් වන අවදානම වැළැක්වීම | | | |
| 103 | • මළකඩ වලින් තොරයි | | | |
| 104 | • කැඩුණු කොටස් වලින් තොරයි | | | |
| 105 | • තියුණු දාර වලින් තොරයි | | | |
| 106 | • කැපෙන කොටස් වලින් තොරයි | | | |
| 107 | • ලී වලින් සකස් කර ඇති ක්‍රීඩා උපකරණ = දිරා ගිය කොටස් වලින් තොරයි | | | |
| 108 | • අවශ්‍ය විට, බිමට තදින් සම්බන්ධ කර ඇත | | | |
| 109 | • ක්‍රීඩා උපකරණ සවිකර ඇති බිමේ ලී කුඩු හෝ වැලි වැනි මෘදු ද්‍රව්‍ය අතුරා ඇත | | | |
| 110 | • දරුවන්ගේ වයසට සරිලන ක්‍රීඩා භාණ්ඩ පමණක් භාවිතා කරයි | | | |
| 111 | • ක්‍රීඩා උපකරණවල ආරක්ෂක වැටවල් වේ නම් ඒවා ඉතා හොඳ තත්ත්වයේ ඇත | | | |
| 112 | • ක්‍රීඩා උපකරණවල ආරක්ෂක වැටවල් වේ නම්, දරුවන්ට ඉන් රිංගා යා නොහැකිවන සේ සකස් කර ඇත | | | |
| 113 | දරුවෙකුගේ බෙල්ල සිර වීමට තරම් දිග (අඟල් 6 ක් හෝ ඊට වැඩි) නූල් සහ රැහැන් සහිත උපකරණ යම් ලෙසකින් [illegible] භාවිතා කරන්නේනම්, ඒවා පාලිකාවන් ගේ අධීක්ෂණය යටතේ තබා ගනියි | | | |
| 114 | සෑම ක්‍රීඩා උපකරණයකම ආරක්ෂිත තත්ත්වය දරුවන් ක්‍රීඩා කිරීමට පෙර පරීක්ෂා කරයි | | | |
| 115 | දරුවන් ක්‍රීඩා කිරීමට පෙර ටයර් වැනි ක්‍රීඩා උපකරණවල සර්පයින් වැනි සතුන් නොසිටින බවට තහවුරු කරයි | | | |
| H | [illegible] | | | |
| 116 | ගෑස්, විදුලිය සහ වෙනත් උපකරණ ළමයින්ට ළංවිය නොහැකි ලෙස තබා ඇත | | | |
| 117 | ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි සැපයුම් රැහැන පොළොවේ සිට අවම වශයෙන් අඩි 10 ක් වත් උසින් ඇත | | | |
| 118 | ඇන්ටෙනාව සහ ප්‍රධාන විදුලි රැහැන අතර අවම දුර අවම වශයෙන් මීටර් 1.5 ක් ඇත | | | |
| 119 | විදුලි රැහැන් ගෙවත්තේ ගස්වල ගෑවෙන්නේ නැත | | | |
| 120 | ට්‍රිප් ස්විච්චයේ කහ පැහැති බොත්තම එබීමේ දී එය ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බව පෙන්වයි | | | |
| 121 | පාවිච්චි කරන විදුලි උපකරණවල වයර්, ප්ලග්, (පේනු) ආදිය පලුදු වී නැත | | | |
| 122 | විදුලි උපකරණ ක්‍රියා විරහිත කරන විට, පළමුව ස්විච්චය වසා පසුව ප්ලග් එක ගලවා තබයි | | | |
| 123 | විදුලි උපකරණ, ප්ලග්, (පේනු) ආදිය දරුවන්ට ළඟා වීමට නොහැකි වන සේ තබා ඇත | | | |
| 124 | භාවිතයේ නොමැති විට විදුලි පේනු, පේනු කුඩු ආරක්ෂිත කවර වලින් වසා ඇත | | | |

True Copy
Communicable Disease Unit
Ministry of Health, Colombo 10.
M. S. Wasantha De Silva
Staff Assistant

| ආරක්ෂාකාරී පිළිවෙත් | ඔව් | නැත | අදාල නැත |
|---|---|---|---|
| **I විෂ වීම් වලින් වන අනතුරු සඳහා වන අවදානම් වැළැක්වීම** | | | |
| සියලුම ඖෂධ, රසායනික ද්‍රව්‍ය, වෙනත් හානිකර ද්‍රව්‍ය සහ අන්තරායකර ගෘහස්ථ හා එළිමහන් පැලෑටි දරුවන්ගෙන් ඈත් කර තබයි | | | |
| සෙල්ලම් බඩු, ගෘහ භාණ්ඩ සහ අභ්‍යන්තර, බාහිර හෝ වෙනත් පෘෂ්ඨ මත ඊයම් මත පදනම් වූ තීන්ත කිසිම විටෙක භාවිතා නොකරයි | | | |
| **J සතුන්ගෙන් වන අනතුරු සඳහා වන අවදානම වැළැක්වීම** | | | |
| 125 බළලුන් බල්ලන් ගවයන් වැනි ගෘහාශ්‍රිත සතුන් පරිශ්‍රයට මුදා හරිනු නොලැබේ | | | |
| 126 බළලුන් සහ බල්ලන් සිටී නම්, ඒ සියළුම සතුන් ජලභීතිකා රෝගයට එන්නත් කර ඇත | | | |
| 127 බළලුන් සහ බල්ලන් සිටී නම්, ඒ සියළුම සතුන් ජලභීතිකා රෝගයට එන්නත් කළ බව තහවුරු කිරීමට එන්නත් කාඩ්පත් තිබේ | | | |
| **K හදිසි අවස්ථාවන්හි දී ක්‍රියාත්මක වීමට ඇති පහසුකම්** | | | |
| 128 අවම වශයෙන් එක් ප්‍රථමාධාර පෙට්ටියක්වත් තිබේ | | | |
| 129 හදිසි අවස්ථා වලදී භාවිතා කිරීමට අවශ්‍ය සියලුම ඖෂධ සහ උපකරණ ප්‍රථමාධාර පෙට්ටියේ ඇත | | | |
| 130 හදිසි අවස්ථා වලදී භාවිතා කිරීමට අවශ්‍ය සියලුම ඖෂධ සහ උපකරණ අවශ්‍ය ප්‍රමාණ වලින් ප්‍රථමාධාර පෙට්ටියේ ඇත | | | |
| 131 ප්‍රථමාධාර පෙට්ටියේ ඇති ඖෂධ සහ වෙනත් උපකරණ පිළිබඳ වාර්තාවක් තිබේ | | | |
| 132 එක් එක් ඖෂධයේ කල් ඉකුත් වීමේ දිනය නිවැරදිව සඳහන් කර ඇත | | | |
| 133 ප්‍රථමාධාර පෙට්ටිය නඩත්තු කිරීම සඳහා වගකිව යුතු අයෙකු සිටී | | | |
| 134 රැකබලා ගන්නන්ට අවම වශයෙන් CPR ඇතුළු මූලික ප්‍රථමාධාර පිළිබඳ කුසලතා ඇත | | | |
| 135 දරුණු ආසාත්මිකතා (ඇනෆිලැක්සිස්) කළමනාකරණය සම්බන්ධයෙන් ලේඛනගත හා අවබෝධ කරගත් ක්‍රියා පටිපාටි ඇත | | | |
| 136 ගිනි නිවීම සඳහා භාවිතා කළ යුතු මූලික උපකරණ තිබේ | | | |
| 137 හදිසි වෛද්‍ය අවශ්‍යතා සඳහා යොමු කිරීමට ආසන්නතම ස්ථානයක වෛද්‍ය වෘත්තිකයෙකු / රෝහලක් හඳුනාගෙන ඇත | | | |
| 138 හදිසි අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට ප්‍රවාහන පහසුකම් ඇත | | | |
| 139 ඕනෑම අවස්ථාවක භාවිතයට ගත හැකි ස්ථාවර හෝ ජංගම දුරකථනයක් ඇත | | | |
| 140 අදාල දුරකථනය පහසුවෙන් ළඟා විය හැකි නියමිත තැනෙක තබා ඇත | | | |
| 141 හදිසි අවස්ථා වලදී අවශ්‍ය වන දුරකථන අංක අදාල දුරකථනය අසල තබා ඇත | | | |
| 142 හදිසි අවස්ථාවකදී ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටියක් තිබේ | | | |
| 143 හදිසි අවස්ථාවකදී ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ අවම වශයෙන් වසරකට වරක්වත් එක් පෙරහුරු අභ්‍යාසයක්වත් පවත්වා ඇත | | | |
| 144 අභ්‍යාස පුහුණු කිරීම් සහ ක්‍රියා පටිපාටි පිළිබඳ ලිඛිත වාර්තා තිබේ | | | |

"අනතුර සෑම විටෙකම සෑම තැනෙකම සැඟවී තිබිය හැකිය.
ඒ පිළිබඳව නිරතුරුවම පරික්ෂාකාරී වන්න"

වැඩි විස්තර සඳහා අමතන්න

1. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය :.........................................
2. මහජන සෞඛ්‍ය පරීක්ෂක :.........................................
3. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී :.........................................


බෝ නොවන රෝග ඒකකය

# සෞඛ්‍ය අමාත්‍යාංශය

**2024**

011 266 9599

acutencd@gmail.com


නිරෝගිමත් ජීවන රටාවක්

බෝනොවන රෝග ඒකකය
සෞඛ්‍ය අමාත්‍යාංශය

True Copy
Director
...Communicable Disease Unit
...y of Health, Colombo 10.
M. S... ...antha De Silva
...t to the

විෂ වීම් සම්බන්ධ තොරතුරු සඳහා අමතන්න : 011 269 1111